**කළුතර මහා නගර සභාව (ගණුදෙනු වාර්තාව) - 2023**

---

කළුතර මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින් ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්‍යය වල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 කළුතර මහා නගර සභාව සංස්ථාපනය කිරීම හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළාත් පාලන හා පළාත් සභා විෂයභාර අමාත්‍යවරයා විසින් 2023 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළුතර නගර සභාව විසුරුවා හැර 2023 මාර්තු 20 දින සිට කළුතර මහා නගර සභාව සංස්ථාපනය කර එම දිනය සභිකයින්ගේ ධූර කාලය ක්‍රියාත්මක වන දිනය ලෙස දක්වා තිබුණි. එහෙත් මහා නගර සභා ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව නියමිත සභික සංඛ්‍යාව තෝරා පත් කරගෙන නොමැති වුවද සභාව ඒ දිනයේදී සංස්ථාපනය කරනු ලැබූ සේ සැලකිය යුතුය. එසේ වුවද මහා නගර සභාව විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 09/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | මහා නගර සභාවේ ගොඩනැගිලි හැර සෙසු වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මේ වන විට රථ වාහන තක්සේරු කර ඇති බව හා සෙසු වත්කම් ප්‍රත්‍යාගණනයට ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව. | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන 22 කට අදාලව ඉන්ධන දහනය යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි. | ඉදිරියේදී සිදු කරන බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 09 ඡේදයේ (iii) වගන්තිය | පෙර සේවා කාලය සතුටුදායක සහ විනය දඬුවම් ලබා නොමැති බව තහවුරු කළ විශ්‍රාමිකයෙකු නැවත සේවයට බඳවා ගත හැකි වුවද, 2017 වර්ෂයේ විනය දඬුවම් ලද විශ්‍රාමික නිලධාරියෙක් 2019 මාර්තු සිට 2023 වර්ෂයේ මාර්තු දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා එකතුව රු.3,576,275 ක් ගෙවා තිබුණි. | අනුමැතිය ලබා ගැනීමේදී විනය නියෝග ඇති බව දැන්වූවද, ආණ්ඩුකාරවරයා අනුමැතිය ලබාදී ඇති බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.31,333,371 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.15,202,901ක් හෙවත් සියයට 48 ක් අයකර නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීම මේ වන විට ආරම්භ කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී**<br>(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට බදුකර කුලී හිඟය රු.93,000 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.68,200 හෙවත් සියයට 73 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ අය කර ගැනීමට ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කරන බව. | -එම- |
| | (ii)බදුකර කුලී වාර්ෂික බිල් කිරීම රු.247,663 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.182,813 ක් හෙවත් සියයට 73 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ අය කර ගැනීමට ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.58,078,025 ක් විය. | 2024 ඔක්තෝබර් 31 දින වන විට රු.45,594,010 ක් ලැබී ඇති අතර ඉතිරිය ඉදිරියේදී අය කරන බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර මහා නගර සභාවට අයත් අක්කර 04 ක භූමිය 2009 දෙසැම්බර් 23 දින සිට 2019 දෙසැම්බර් 23 දක්වා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට බදු දී තිබුණද 2009 වසරේ සිට 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම ප්‍රකාරව කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එම භූමියට තක්සේරුවක් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | හිඟ බදු අයකළ යුතුය. |
| (ආ) | 2009 දෙසැම්බර් 23 දින අත්සන් කරන ලද බදු ගිවිසුමේ කාලය 2019 වසරේ අවසන් වී තිබුණද නව ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ව්‍යාපාරික කටයුතු සිදු කර තිබූ අතර නැවත 2023 අගෝස්තු සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා නොදිරන කසළ ලබා ගැනීම වෙනුවෙන් ටොන් එකකට රු.4,500 ක් කළුතර මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවිය යුතුය යන සභාවට අවාසිදායක කොන්දේසියක් ඇතුළත් කොට ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව අවුරුදු 14 ක හිඟ බදුකුලී අය කිරීමකින් තොරව නොදිරන කසළ මෙට්‍රික් ටොන් 351 වෙනුවෙන් එකතුව රු.1,880,130 ක් 2023 වර්ෂයේ අවසන් මාස 05 තුළ මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවා තිබුණි. | 2024 ජනවාරි 26 සිට වසරක කාලයකට සභාවේ දිරන කසළ ගාස්තු අය කිරීමකින් තොරව ලබා ගැනීමටත් ඒ වෙනුවට භූමිය භාවිතා කිරීමටත් ගිවිසුම්ගත වී ඇති බව හා නොදිරන කසළ ප්‍රතිප්‍රවාහනය සඳහා 2023 අගෝස්තු 01 දින සිට වසරක කාලයකට පිළිසරු ව්‍යාපෘතිය සමඟ ගිවිසුම්ගත වී ඇති බව. | සභාව සතු දේපල විධිමත්ව බදු දිය යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ දක්වන ලද රු.43,500 ක් වූ කෝලාස් බැරල් 02 ක ඌනතාවයත්, විධිමත් අනුමැතියකින් තොරව පිලිප්නේරි පල්ලියේ අභ්‍යන්තර මාර්ගය සංවර්ධනය වෙනුවෙන් ගබඩාවෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීමත්, නිකුත් කිරීම් නියෝග 242 යටතේ තාර ආලේප සඳහා බැරල් 04 ක් නිකුත් කර තිබුණද තාර ආලේප කර නොතිබීම හා එම බැරල් 04 වැඩ පාලක භාරයේ නොතිබීම යන කාරණා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 සහ 156 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | නිකුත් කිරීමේ නියෝග නොමැතිව සභාපතිගේ නියෝගය මත නගර සභාවේ පාරවල් පිළිසකර කිරීමට තාර බැරල් යොදා ඇති බැවින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම අදාල නොවන බව. | විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සතු කඩ කාමර 64 ක් සඳහා කාලීනව බදු ගිවිසුම් අළුත් කිරීමටත් මහා නගර සභාවට අයත් නමුත් සභාව සතුව ලිපිගොනු නොමැති කඩ කාමර 08 ක් සභාව වෙත නැවත පවරාගෙන ටෙන්ඩර් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කරන බව . | බදු ගිවිසුම් කාලීනව අළුත් කළ යුතු අතර සභාව සතු දේපල වල අයිතිය තහවුරු කරන ලේඛන තබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සුපිරි සාප්පු සංකීර්ණයේ කඩ කාමර 138ක් 2021 වර්ෂයේ සිට බදු දී තිබුණද, ඉන් කඩ කාමර 17 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර 2021 වර්ෂයේ සිටම සභා තීරණයක් මත කඩ කුලී අයකර ගෙන නොතිබුණි. | මුද්‍රා තබා සභාවට පවරාගෙන ඇති බව. | ලැබිය යුතු ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බදුකරුවන් විසින් ව්‍යාපාරික කටයුතු නොකර වසා දමා තිබූ කඩ කාමර 106 ක් සම්බන්ධයෙන් බදු ගිවිසුමේ 19 වන කොන්දේසිය ප්‍රකාරවද, බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බදු ගිවිසුමේ 21 වගන්තිය ප්‍රකාරවද මහා නගර සභාව කටයුතු කර නොතිබූ අතර මහා නගර සභාවට ලැබිය යුතු වාර්ෂික කඩ කුලීය වසර 03 ක සිට බිල් නොකිරීම නිසා සභාවට එකතුව රු.21,000,000 කට ආසන්න ආදායමක් අහිමි වී තිබුණි. | වෙළඳ සංකීර්ණයේ ව්‍යුහාත්මක පිහිටීම මත ව්‍යාපාර ආරම්භ කර නොමැති බව හා සභා තීරණයක් මත කඩ කුලී අය නොකළ බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 මාර්තු 02 දිනැති යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ අනුව සභාව සතු සොලෙක්ස් වතුර බවුසරය, සක්සන් පොම්පය සහිත බවුසරය සහ නිසාන් ගිනි රථය අළුත්වැඩියා කිරීම , ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව සඳහන් වුවත් එම වාහන සම්බන්ධයෙන් 2023 වර්ෂය අවසාන වන විටත් කිසිඳු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ අතර එම වාහන 03 සභාව නමින් ලියාපදිංචි කරද නොතිබුණි. | මෝටර් රථ කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | අදාල අඩුපාඩු නිවැරදි කර යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2022 ඔක්තෝබර් 16 දිනැති තක්සේරු වාර්තාවෙන් අපහරණය සඳහා නිර්දේශ කරන ලද සභාව සතු ට්‍රැක්ටර් දෙකක අංක තහඩු නොමැතිවීමෙන් 2023 වර්ෂය අවසාන වන විටත් අපහරණය කර නොතිබුණි. | ක්‍රියා මාර්ග ගනිමින් ඇති බව. | -එම- |
| (ඇ) | සභාව සතු ට්‍රැක්ටර් ට්‍රේලරය සහ ට්‍රැක්ටරය 2021 වර්ෂයේ සිට අපහරණය සඳහා හඳුනාගෙන තිබුණද, 2023 වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බව. | -එම- |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මහා නගර සභාව විසින් රැස් කරන නොදිරන කසළ කෙරවලපිටිය තාප බලාගාරය වෙත ප්‍රවාහනය සඳහා ටිපර් රථයක් කුලියට ගැනීමට අදාල 2022 ඔක්තෝබර් 10 දිනැති ප්‍රසම්පාදනයේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 ඡේදය ප්‍රකාරව ලංසු ඇගයීම සිදු කරන අතරතුර කලින් දැක්වූ උපමාන වෙනස් කිරීම හෝ අතිරේක උපමාන ඇතුළත් කිරීම නොකළ යුතු වුවද, ලංසු ඇගයීම් කරන අතරතුර නව උපමාන දෙකක් ඇතුලත් කර ඇගයීම් කර තිබුණි. මෙලෙස නව උපමාන ඇතුලත් කිරීම නිසා රු.24,000 ක් වූ අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුට ටෙන්ඩරය ප්‍රදානය කරනු වෙනුවට රු.37,900 ක ඉහල මිලක් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරුට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට මහා නගර සභාව කටයුතු කර තිබුණි. | නිර්නායක ප්‍රමාණවත් නොවීම නිසා ටෙන්ඩර්කරුවන් එකඟ කරවාගෙන අතිරේක උපමාන සැකසූ බව හා ඒ අනුව ඇඟයීම් කර ඇති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.6 වගන්තිය ප්‍රකාරව ලංසු ලේඛනවල අන්තර්ගත සියලු කොන්දේසිවලට අනුකූලව ලංසු ඉදිරිපත් කර තිබේද යන්න ඇගයිය යුතු වුවද, ටෙන්ඩර් ඇගයීම් කරන අවස්ථාවේ "කසල ප්‍රවාහනයට යොදවන වාහනය තමා නමට ලියාපදිංචි වී තිබිය යුතුය" යන කොන්දේසිය සපුරා නොතිබුණු ආයතනයට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | දෙවන වර ඇගයීමේදී ඉදිරිපත් කළ කොන්දේසි අනුව ක්‍රියා කළ බව. | -එම- |
| (ඇ) | මෙලෙස ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ රීතිවලට පටහැනිව ටෙන්ඩරය ප්‍රදානය කිරීම නිසා 2023 ජනවාරි සහ පෙබරවාරි මාස 02 තුල ගමන්වාර 12 ක් වෙනුවෙන් රු.166,800 ක් වැඩිපුර ගෙවීම් කර තිබූ අතර 2023 වර්ෂය අවසාන වන විටත් මූල්‍ය අලාභයට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය කර ඇති බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක විය යුතු බව දැක්වෙතත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් ඉඩම් අනුබෙදුම් සහතික කිරීම්, වරිපනම් හා කඩ කුලී අය කර ගැනීම්, වාහන උපයෝජනය , ප්‍රසම්පාදනය වැනි විෂයයන් සම්බන්ධ ප්‍රමාණවත් විගණනයක් සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී එම අංශ පරීක්ෂාවට ලක් කරන බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 129 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල එක් රැස් වන මල අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම සඳහා වර්ෂ තුනක සිට සභාව විසින් ගලි රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පවතින ගලි බවුසර ගර්භිත බැවින් නව ගලි බවුසරයක් මිලට ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති බව. | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |